00069

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන - පස්වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2014**

**ESU3130 - ළමා අයිතිවාසිකම්**

**කාලය - පැය තුනයි.**

---

**දිනය - 2014.02.28** **වේලාව - ප.ව.01.30 - ප.ව. 04.30**

---

**I වන කොටසේ සියලු ම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑ ම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## I වන කොටස

01. යටත් විජිත යුගයට පෙර ශ්‍රී ලංකාවේ ළමයින් සම්බන්ධව පැවැති තත්ත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ළමා හා මාතෘ රැකවරණය සඳහා ශ්‍රී ලංකාවේ රජයන් ගෙන ඇති ක්‍රියා මාර්ග පහක් (05) ලියන්න.

03. "වෙන් කොට නොසැලකීමේ මූලධර්මය" යන්නෙහි අර්ථය කුමක්දැයි දක්වන්න.

04. විශේෂිත තත්ත්වයේ පසුවන දරුවන්ගේ සංවර්ධනයට දායක විය හැකි කාරකයන් හතරක් (04) නම් කරන්න.

05. ළමයින් සතු සහභාගිත්වය සඳහා ඇති අයිතිය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

06. ළමා අයිතිවාසිකම් පිළිබඳ ඵලදායි සන්නිවේදනය කෙරෙයි බාධාකාරී ලෙස බලපාන සාධක තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

07. "අපත්‍යීකරණය" යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.

08. ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා පාසල් විවේක කාලයේ දී ගුරුවරයෙකුට දැරිය හැකි වගකීම් පහක් (05) ලියන්න.

(ලකුණු 5 x 8 = 50)

6

## II වන කොටස

09. i. ළමා අයිතිවාසිකම් යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

(ලකුණු 03)

ii. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි දක්වා ඇති අයිතිවාසිකම් කාණ්ඩ හතර (04) නම් කරන්න.

(ලකුණු 05)

iii. ශ්‍රී ලංකාවේ ළමයින්ගේ සුරක්ෂණ අයිතිවාසිකම් ප්‍රවර්ධනය සඳහා රජය ගෙන ඇති පියවර මොනවාද?

(ලකුණු 12)

10. ii. නිදහසින් පසු සම්මත කරගන්නා ලද ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් සම්බන්ධව ඇති පනත් පහක් (05) නම් කරන්න.

(ලකුණු 05)

ii. ඔබ ඉහත සඳහන් කළ එක් පනතක් විස්තර කරන්න.

(ලකුණු 15)

11. "ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂණ අධිකාරිය ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා විශිෂ්ට මෙහෙවරක යෙදෙයි". ඔබ මීට එකඟ වේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 20)

12. i. ළමයාගේ වර්ධනය හා සංවර්ධනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 08)

ii. ළමයාගේ සමාජයීය සංවර්ධනය පිළිබඳ මූලික වගකීම පවුල නමැති කාරකය වන බවට හේතු කවරේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 12)

13. i. “ ශ්‍රී ලංකාවේ ළමයින් පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම අවතැන්වූ ළමයින්ගේ සුභ සාධනය සඳහා වන වැඩසටහන් ගණනාවක් විස්තර කරයි” ඉන් හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ii. ඉහත සඳහන් කළ වැඩසටහනක් සඳහා රාජ්‍ය නො වන සංවිධානවලට දායක විය හැකි ආකාරය විස්තර කරන්න.

(ලකුණු 12)

14. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑ ම දෙකක් (02) සඳහා කෙටි සටහන් ලියන්න.

i. ළමයින්ගේ තත්ත්වය ඉහළ නැංවීම සඳහා ලන්දේසි යුගයේදී ගත් පියවර

ii. ළමයා ළමා අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු ලබන්නෙකු ලෙස

iii. ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනය

iv. ළමයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සන්නිවේදකයකු ලෙස ගුරු භූමිකාව

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි